# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2095/44 - 2018 නොවැම්බර් මස 02 වැනි සිකුරාදා - 2018.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීම (සංශෝධන) පනතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ගොනු අංකය*.: GAL/LAN/ACQUIS/A13/34.
*ඉඩම් අමාත්‍යාංශ අංකය*: 4-3/9/2016/WS/70

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/ පරවශතාවයේ විස්තරය:*

සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඳුපිට පත්තුව උතුර සුළු කොට්ඨාසයේ, අංක 71 කොබ්බෑවෙල ග්‍රාම නිලධාරි වසමේ කොබ්බෑවෙල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද කෑ 3626 හා 2018.10.11 දිනැති මූලික පිඹුර අනුව මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0766 වූ ඉඩම් කොටස.

01. කැබලි අංක 01
ඉඩමේ නම: කන්දෙහේන; හිමිකම් කියන අය: එස්. එම්. නිමල් කරුණාතිලක, අංක 569/108, බණ්ඩාරනායක පෙදෙස, කළගෙඩිහේන, තිහාරිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0007.

02. කැබලි අංක 02
ඉඩමේ නම: කන්දෙහේන; හිමිකම් කියන අය: එස්. එම්. නිමල් කරුණාතිලක, අංක 569/108, බණ්ඩාරනායක පෙදෙස, කළගෙඩිහේන, තිහාරිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0756.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018.11.14 වැනි දින පූ.භා. 10.00 ට ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018.11.07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එච්. එම්. සී. සුසන්ත හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
ගලිගමුව.

2018 ඔක්තෝබර් මස 31 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

11-726


1A - G 28838 - 17 (2018/11)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.